**Trial Monitoring report (නඩු විභාග අධීක්ෂණ වාර්තාව)**

**About the case (කුමන නඩුවක් සම්බන්ධයෙන් ද):** පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල වන බවට තොරතුරු ලැබී තිබියදීත් එය පොලීසියට වසන් කළේ යැයි චෝදනා කරමින් මොහොමඩ් ඊබ්‍රහිම් ඇතුළු විත්තිකරුවන් 03 දෙනෙකුට එරෙහිව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පවරා ඇති නඩුවකි.

**Case no (නඩු අංකය):** HC 3072/21

**Courts (අධිකරණය):** කොළඹ මහාධිකරණ අංක 7

**Date of hearing (නඩුව අසන ලද දිනය):** 2025 සැප්තැම්බර් මස 09 වන දින

**Author (s) of report (වාර්තාවේ කතෘ හෝ කතෘන්):** නීතිඥ හිරුණි පෙරේරා

**1. Who was in courts:**

| **Who** | **Names / other information** | **Comments** |
|---|---|---|
| **Judge (s) (විනිසුරු හෝ විනිසුරුවරුන්)** | විනිසුරු ලංකා ජයරත්න මැතිනිය | |
| **Attorney General's Dept. (නීතිපති දෙපාතර්මේන්තුව)** | නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් ලක්මිණි ගිරිහාගම | |
| **Police (CID / TID etc.) (පොලීසිය - අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව/ත්‍රස්ත විමශර්න ඒකකය/ වෙනත්)** | - | |
| **Accused / Suspects (චූදිත/ සැකකරුවන්)** | **1.** මොහොමඩ් යූසුෆ් මොහමඩ් ඊබ්‍රාහීම්<br>**2.** මොහමඩ් ඊබ්‍රාහීම් ඉජාස් අහමඩ්<br>**3.** මොහමඩ් ඊබ්‍රාහීම් ඉස්මයිල් අහමඩ් | |
| **Lawyers for accused / suspects (චූදිතයන් / සැකකරුවන් වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | 1 චූදිත වෙනුවෙන් ජනාධිපති නීතිඥ අනුජ ප්‍රේමරත්න<br>2 චූදිත වෙනුවෙන් නීතිඥ චමින්ද අතුකෝරළ<br>3 චූදිත වෙනුවෙන් ජනාධිපති නීතිඥ නලින්ද ඉන්දතිස්ස | |
| **Aggrieved party (අගතියට පත් පාශර්වය)** | - | |
| **Lawyers for aggrieved party (අගතියට පත් පාශර්වය වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | - | |
| **Supporters of accused / suspects (චූදිතයන්ගේ / සැකකරුවන්ගේ ආධාරකරුවන්)** | - | |

| | | |
|---|---|---|
| **Supporters of aggrieved party (අගතියට පත් පාශර්වයේ ආධාරකරුවන්)** | - | |
| **Others (වෙනත් අය)** | පැමිණිල්ලේ සාක්ෂි අංක 1 වෙනුවෙන් නීතිඥ රුවන් ප්‍රේමදාස මහතා පෙනී සිටින ලදී. | |

## 2. What happened in the court hearing (උසාවි විභාගයේදී සිදු වූ දේ)?

1, 2 සහ 3 වන වූදිතයන් අධිකරණය ඉදිරියේ පෙනී සිටින ලදී. පැමිණිල්ලේ සාක්ෂි අංක 4 සහ 1 අධිකරණය ඉදිරියේ පෙනී සිටින ලදී.

1 වන වූදිත වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ අනුජ ප්‍රේමරත්න මහතා 1 වන වූදිත වෙනුවෙන් පැමිණිල්ලේ සාක්ෂි අංක 4 ගෙන් වැඩිදුර හරස් ප්‍රශ්න නොමැති බවට අධිකරණයට දන්වා සිටින ලදී. පැමිණිල්ලේ සාක්ෂි අංක 4 ගෙන් 2 වන වූදිත වෙනුවෙන් හරස් ප්‍රශ්න විමසා සිටින ලදි.

එහිදී 2 වන වූදිත වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා පැමිණිල්ලේ සාක්ෂි අංක 4 ගෙන් විමසා සිටියේ ඇය 2 වන වූදිතගේ නිවසේ මෙහෙකාර සේවයට යාමට ප්‍රථමව වෙනත් වත්තල පිහිටි නිවසක මෙහෙකාර සේවයට ගොස් තිබුණේද යන්නයි. එවිට, පැමිණිල්ලේ සාක්ෂි අංක 4 තමා එලෙස වත්තල නිවසක මෙහෙකාර සේවයේ යෙදී නොසිටි බව මුලින් පැවසුව ද පසුව සාක්ෂි දෙමින් පවසා සිටියේ, තමා 2 වන වූදිතගේ නිවසේ මෙහෙකාර සේවයට පැමිණීමට පෙර වත්තල පිහිටි නිවසක මාස හයක් පමණ මෙහෙකාර සේවයේ යෙදී සිටි බවත්, එම නිවසේ අයිතිකරුවන්ගේ නම් තමාට මේ මොහොතේදී මතක නොමැති බවත් එම නිවසේ හිමිකාරිය ඉන්දියාවට ගියපසු එම නිවසේ මෙහෙකාර සේවයෙන් තමා ඉවත් වූ බවත් ය.

එමෙන්ම ඉන්පසු කොළඹ කොස් ගස් කන්ද ප්‍රදේශයේ ඇහලුම් හලක මාස කිහිපයක් සේවය කළ බවත් එහිදී තමා ලැබූ වැටුප ප්‍රමාණවත් නොවීම නිසා එම රැකියා ස්ථානයෙන්ද ඉවත් වූ බව පැමිණිල්ලේ සාක්ෂි අංක 4 අධිකරණය ඉදිරියේ පවසා සිටින ලදී. පැමිණිල්ලේ සාක්ෂි අංක 4 හට සිංහල භාෂාව තේරුම් ගැනීමට අපහසු තැන්වල දෙමළ භාෂාවෙන් වුවද පිළිතුරු ලබා දිය හැකි බව මහාධිකරණ විනිසුරුවරිය දන්වා සිටින ලදී. තවදුරටත් පැමිණිල්ලේ සාක්ෂි අංක 4 අධිකරණ ඉදිරියේ පවසා සිටියේ, අනතුරුව තමා 2 වන වූදිතගේ නිවසේ මෙහෙකාර සේවයට පැමිණි බවත්, තමාට 2 වන වූදිතගේ හෝ ඔහුගේ බිරිඳගේ නම් මතක නොමැති බවත්, තමා එම බෝම්බය පිපුරුණු නිවසට එම බෝම්බය පිපිරීමට ප්‍රථමව යම් අවස්ථාවලදී ගොස් තිබෙන බවත් තමා 2 වන වූදිතගේ පවුලේ සියලු දෙනාව දන්නා නමුත් ඔවුන්ගේ නම් කිසිවක් නොදන්නා බවත්ය.

බෝම්බය පිපිරුණු මොහොතේ 3 වන වූදිත කලබලයෙන් එම නිවසට පැමිණි බවට පැමිණිල්ලේ සාක්ෂි අංක 4 මෙම අධිකරණයේ ලබා දී තිබෙන සාක්ෂිය, මීට ප්‍රථමව ඇය විසින් 2019.05.06 වන දින අපරාධ විමශර්න ඒකකයට ලබා දී තිබෙන ප්‍රකාශයේද, 2019.04.23 වෙන දින දෙමටගොඩ පොලිස් ස්ථානයට ලබා දී තිබෙන ප්‍රකාශයේද සඳහන් කර නොතිබෙන බැවින් අද දින පැමිණිල්ලේ සාක්ෂි අංක 4 අපරාධ විමශර්න දෙපාතර්මේන්තුවේ නිලධාරීන්ගේ ඉගැන්වීම් අනුව පැමිණ මෙම අධිකරණය ඉදිරියේ අලුත් කතාවක් ගොතමින් සාක්ෂි ලබා දෙන බවට 2 වන වූදිත වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා පැමිණිල්ලේ

සාක්ෂි අංක 4 ට යෝජනා කර සිටින ලදී. එහිදී පැමිණිල්ලේ සාක්ෂි අංක 4 එය ප්‍රතික්ෂේප කර සිටින ලදී. එමෙන්ම, පැමිණිල්ලේ සාක්ෂි අංක 4 අධිකරණයට පවසා සිටියේ බෝම්බය පිපිරුණු මොහොතේ 3 වන චූදිත කලබලයෙන් නිවසට පැමිණි බවට සඳහන් කිරීමට එම කට උත්තර ලබාදෙන අවස්ථාවලදී තමා හට අමතක වූ බවයි.

එමෙන්ම, දෙමටගොඩ නිවසේ බෝම්බය පිපුරුණු අවස්ථාවේ 2 වන චූදිතගේ බිරිඳ 3 වන චූදිතව එම නිවසේ මුළුතැන්ගෙට එවන ලද බවට පැමිණිල්ලේ සාක්ෂි අංක 4 මෙම අධිකරණය ලබා දී තිබෙන සාක්ෂිය මීට ප්‍රථමව ඇය විසින් 2019.05.06 වන දින අපරාධ විමශර්න දෙපාතර්මේන්තුවට ලබා දී තිබෙන ප්‍රකාශයේද, 2019.04.23 වෙන දින දෙමටගොඩ පොලිස් ස්ථානයට ලබා දී තිබෙන ප්‍රකාශයේද සඳහන් කර නොමැති බව 2 වන චූදිත වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා අධිකරණයට දැනුම් දෙන ලදී.

අනතුරුව 2 වන චූදිත වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා පැමිණිල්ලේ සාක්ෂි අංක 4 ගෙන් විමසා සිටියේ දෙමටගොඩ මහල් නිවාසයේ සිදුවූ බෝම්බ පිපිරීමෙන් මිය ගිය කාන්තාව 'ෆාතිමා' නම් කාන්තාව බවට ඇය දන්නේද යනුවෙනි. එවිට පැමිණිල්ලේ සාක්ෂි අංක 4 පවසා සිටියේ එලෙස මියගියේ ෆාතිමා බව තමා දැන සිටි බවත් තමා එම නිවසේ සේවය කරන විට 2 වන චූදිතගේ මව විසින් බෝම්බ පිපිරීමෙන් මියගිය කාන්තාවට ෆාතිමා නමින් කතා කරන බව තමාට ඇසී තිබෙන බවයි. ඒ අනුව, 2 වන චූදිත වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා අධිකරණයට දැනුම් දුන්නේ 2 වන චූදිත වෙනුවෙන් හරස් ප්‍රශ්න අවසන් බවයි.

ඉන් පසු පැමිණිල්ලේ සාක්ෂි අංක 4 ගෙන් 3 වන චූදිත වෙනුවෙන් හරස් ප්‍රශ්න අසා සිටින ලදී. එහිදී පැමිණිල්ලේ සාක්ෂි අංක 4 අධිකරණයට පවසා සිටියේ දෙමටගොඩ මහල් නිවාසයේ බෝම්බය පිපුරුණු අවස්ථාවේ 3 වන චූදිත එම නිවසේ නොසිටි බවත්, පසුව නිවසට පොලිසියෙන් පැමිණි අවස්ථාවේදීද 3 වන චූදිත නිවසේ නොසිටි බවත්ය.

අනතුරුව පැමිණිල්ලේ සාක්ෂි අංක 4න් නැවත ප්‍රශ්න විමසා සිටින ලදී. එහිදී පැමිණිල්ලේ සාක්ෂි අංක 4 විසින් 2 වන චූදිත පදිංචිව සිටි දෙමටගොඩ මහල් නිවසට ගියේ කුමන වේලාවකද යනුවෙන් අසා සිටින ලදී. එවිට පැමිණිල්ලේ සාක්ෂි අංක 4 තමා එම නිවසට ගිය අවස්ථාවේ කෑම මේසයක් පිළියෙල කර තිබෙන දුටු බවත් එලෙස සූදානම් කර තිබුණේ දවල් ආහාරය ලබා ගැනීම සඳහා බවත් නමුත් බෝම්බය පිපිරෙන අවස්ථාව වනතෙක් නිවසේ කවුරුන් හෝ කෑම මේසයට පැමිණ ආහාර නොගත් බවත් පවසා සිටින ලදී. අනතුරුව පැමිණිල්ලේ සාක්ෂි අංක 4ගෙන් 2 වන චූදිතගේ නිවසේ මෙහෙකාර සේවයට පැමිණීමට පෙර සේවය කළ නිවසේ අයිතිකරුවන්ගේ නම් දැන සිටියේද යනුවෙන් විමසා සිටින ලදී. එහිදී පැමිණිල්ලේ සාක්ෂි අංක 4 පවසා සිටියේ තමා අයිතිකරුවන්ගේ නම් නොදන්නා බවත් එම නිවසේ සේවය කරද්දී තමා ඔවුන්ට "නෝනා මහත්තයා" යනුවෙන් ආමන්ත්‍රණය කරන ලද බවත්ය.

එමෙන්ම, ෆාතිමා යන අයව පැමිණිල්ලේ සාක්ෂි අංක 4 විසින් හඳුනන්නේ කෙලෙසින් දැයි නැවත ප්‍රශ්න අසා සිටින ලද අතර එම නිවසේ සිටි අය විසින් එම කාන්තාවට ෆාතිමා නමින් ආමන්ත්‍රණය කරනවා තමාට ඇසී තිබෙන බවට පැමිණිල්ලේ සාක්ෂි අංක 4 පවසා සිටින ලදී. එමෙන්ම පැමිණිල්ලේ සාක්ෂි අංක 4 පවසා සිටියේ අද දින අධිකරණයට පැමිණීමට පෙර තමාට අපරාධ විමශර්න දෙපාතර්මේන්තුවේ නිලධාරීන් මුණ

නොගැසුණු බවත් එමෙන්ම එම නිලධාරීන් විසින් අධිකරණය ඉදිරියේ කිසිවක් කියා සිටින ලෙසට තමාට උපදෙස් ලබා නොදුන් බවත්ය.

එලෙස පැමිණිල්ලේ සාක්ෂි අංක 4 ගෙන් සාක්ෂි විමසීම අවසන් කරන ලදී.

අනතුරුව, සාක්ෂි ලබාදීම සඳහා මෙම අධිකරණයට පැමිණීමට පැමිණිල්ලේ සාක්ෂි අංක 4 හට වැයවී තිබෙන ගමන් වියදම් ලබා දෙන ලෙසට නියෝගයක් කරන මෙන් රජයේ නීතිඥවරිය මහාධිකරණ විනිසුරුතුමියගෙන් ඉල්ලා සිටි අතර, ඒ අනුව, පැමිණිල්ලේ සාක්ෂි අංක 4 හැටන් වැනි දුර ප්‍රදේශයක සිට මෙම අධිකරණයට සාක්ෂි ලබා දීමට පැමිණ තිබෙන බවත් ඇයට රැකියාවක් නොමැති බවත් සැලකිල්ලට ගෙන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 243 වගන්තිය ප්‍රකාරව, ඇයගේ ලිපිනයේ සිට අධිකරණයටත්, නැවත අධිකරණයේ සිට ඇගේ ලිපිනයටත් යාමට වැයවී තිබෙන ගමන් වියදම් මහාධිකරණය මගින් ලබාදීමට නියෝග කරන ලදී.

ඉන්පසුව පැමිණිල්ලේ සාක්ෂි අංක 1 ගෙන් මූලික සාක්ෂි විමසීම ආරම්භ කරන ලදී.

ඒ අනුව, පැමිණිල්ලේ සාක්ෂි අංක 1 තමා 1991 නොවැම්බර් මස 30 වන දින මහනුවරදී උපත ලැබූ බවත්, තම පියාට හිමි රත්‍රං ආභරණ අලෙවි කිරීමේ ව්‍යාපාරයක් තම සහෝදරයා සමග එක්ව පවත්වාගෙන යන බවත්, තමා විවාහ වී සිටින්නේ 1 වන වූදිතගේ දියණියක වන ෆාතිමා ඉබාදා සමග බවත් විවාහයේදී දෑවැද්ද වශයෙන් 1 වන වූදිත විසින් තමාට CAR 6555 අංකය දරණ BMW වගර්යේ මෝටර් රථයක් ලබා දුන් බවත්, තමා සහ තමාගේ බිරිඳ ෆාතිමා ඉබාදා සෑම මසකට වරක්ම දෙමටගොඩ මහගෙදර පැමිණ දින 3ක් හෝ දින 5ක් නැවතී සිටින බවත්, පුද්ගලයන් කිහිප දෙනෙකු මහවිල ගා(ර්)ඩන්ස් හි පිහිටි මහ ගෙදර මෙහෙකාර සේවයේ නිරතව සිටි බවත් තමා 1 වන වූදිතගේ දරුවන් හොඳින් හඳුනන බවත්, ඔවුන් සමග හොඳින් කතාබහ කර තිබෙන බවත්, 1 වන වූදිතගේ දරුවකු වන ඉල්හාම් අහමඩ් පාස්කු ප්‍රහාරය සිදුවූ දින ඔහු විසින්ම බෝම්බයක් පුපුරවාගෙන මියගිය බවත් අධිකරණය ඉදිරියේ සාක්ෂි දෙමින් පවසා සිටින ලදී.

එසේම අධිකරණය ඉදිරියේ තවදුරටත් සාක්ෂි දෙමින් පැමිණිල්ලේ සාක්ෂි අංක 1 පවසා සිටියේ ඉල්හාම් අහමඩ් මහවිල ගා(ර්)ඩන්ස් හි පිහිටි නිවසේ පළමු වන මහලේ පදිංචිව සිටි බවත් ඔහු නිවසේ බෝම්බය පුපුරා ගිය අවස්ථාවේ නිවසේ නොසිටි බවත් ය. තවද 1 වූදිතගේ තවත් පුතෙකු වන ඉන්ෂාෆ් අහමඩ් ද පාස්කු ප්‍රහාරය සිදුවූ දින එලෙසම තමා විසින්ම බෝම්බයක් පුපුරවාගෙන මියගිය බවත්, එමෙන්ම 1 වන වූදිතට ඉජාස් අහමඩ් නමින් තවත් පුතෙකු සිටින බවත් ය. එසේම පැමිණිල්ලේ සාක්ෂි අංක 1 විසින් ඉජාස් අහමඩ් මෙම නඩුවේ 2 වන වූදිත වශයෙන් සිටින බවට හඳුනා ගන්නා ලදී.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1 අධිකරණයේ ඉදිරියේ තවදුරටත් සාක්ෂි දෙමින් පවසා සිටියේ 2 වන වූදිත හට මහවිල ගා(ර්)ඩන්ස් හි තවත් නිවසක් තිබූ බවත් එම නිවස පිහිටා තිබුණේ මහ ගෙදර සිට ඇවිදගෙන යා හැකි දුරක බවත් ය. එමෙන්ම 2019 අප්‍රේල් මස 21 වන දින තම බිරිඳගේ සහෝදරයන් දෙදෙනෙක් ඔවුන් විසින්ම බෝම්බ පුපුරවා ගනිමින් මියගිය බව පැමිණිල්ලේ සාක්ෂි අංක 1 සාක්ෂි දෙමින් පවසා සිටින ලදී. පැමිණිල්ලේ සාක්ෂි අංක 1 තවදුරටත් පවසා සිටියේ තමා සහ තමාගේ බිරිඳ 2019 අප්‍රේල් මස 21 වන දිනට දින 4කට හෝ 5කට පෙර නුවර සිට මහවිල ගා(ර්)ඩන්ස් හි පිහිටි මහ ගෙදරට පැමිණි බවත් තමා එම නිවසේ තම බිරිඳ නතර කර ආපසු නුවර ගිය බවත් පසුව නැවත මහවිල ගා(ර්)ඩන්ස් හි පිහිටි නිවසේ බෝම්බ පිපිරීම

සිදුවීමට දින 3කට පෙර තමා දුම්රියෙන් නුවර සිට එම නිවසට පැමිණි බවත් එම නිවසේ දෙවන මහලේ ඉල්හාම් අහමඩ් සිටි කාමරයට යාබද කාමරයක බිරිඳ සමග නැවතී සිටි බවත්ය.

තවද තමා නැවතී සිටි කාමරයට යාබදව තිබූ ඉල්හාම් අහමඩ්ගේ කාමරයේ ඉල්හාම් අහමඩ් සහ ඔහුගේ බිරිඳ වූ ෆාතිමා ජිෆ්රියා ජීවත් වූ බවත් ෆාතිමා ජිෆ්රියා 2019 අප්‍රේල් මස 21 වන දින මහවිල ගා(ර්)ඩන්ස් හි පිහිටි මහ ගෙදර සිදුවූ බෝම්බ පිපිරීමෙන් මියගිය බවත් පැමිණිල්ලේ සාක්ෂි අංක 1 සාක්ෂි දෙමින් පවසා සිටින ලදී. එමෙන්ම පැමිණිල්ලේ සාක්ෂි අංක 1 පවසා සිටියේ තමා නුවර සිට මහවිල ගා(ර්)ඩන්ස් හි පිහිටි මහ ගෙදරට පැමිණි පසු ඉල්හාම් අහමඩ් සමග කීප වතාවක් කතාබස් කර තිබෙන බවත් ඔහු සමග කතාබහ කිරීමේදී ඔහුට තමා අදහන ඉස්ලාම් ආගමට වෙනස් වූ ආගමික ප්‍රතිපත්තීන් තිබෙන බව පැමිණිල්ලේ සාක්ෂි අංක 1 හට තේරුම් ගිය බවත්ය. ඉල්හාම් අහමඩ් ඡන්දය දැමීමට අකමැති බවත් දේශපාලනය දැඩිව ප්‍රතික්ෂේප කළ බවත් වෙනත් රටවල ඉස්ලාම් භක්තිකයන්ට විරුද්ධව සිදුවන ප්‍රහාර පිළිබඳ ඔහුට දැඩි කනස්සල්ලක් තිබුණ බවත් ය.

එමෙන්ම 2019 අප්‍රේල් මස 21 වන දින සිදුවූ බෝම්බ ප්‍රහාරයට දින 2කට පෙර මහවිල ගා(ර්)ඩන්ස් හි පිහිටි මහ ගෙදරදී රාත්‍රී කාලයේදී පැමිණිල්ලේ සාක්ෂි අංක 1 හට ඉල්හාම් අහමඩ් මුණ ගැසුණු බවත්, ඔහු තමාගෙන් "කවදද ආවේ" යනුවෙන් ඇසූ බවත් ඉන්පසු ටික මොහොතකින් ඔහු පිටව ගිය බවත් පැමිණිල්ලේ සාක්ෂි අංක 1 අධිකරණය ඉදිරියේ සාක්ෂි දෙමින් පවසා සිටින ලදී.

තවද පැමිණිල්ලේ සාක්ෂි අංක 1 අධිකරණය ඉදිරියේ සාක්ෂි දෙමින් පවසා සිටියේ ඉල්හාම් අහමඩ් සහ ඉන්ෂාෆ් අහමඩ් යන දෙදෙනාටම තමා අදහන ඉස්ලාම් ආගමට වෙනස් වූ ආගමික ප්‍රතිපත්තීන් පැවැති බවත් ඔවුන් ඒ බව පවුලේ සෑම දෙනා ඉදිරියේම පවසා තිබෙන බවත් ය. ඉල්හාම් අහමඩ් 'අන්වර්' නමැති ISIS සංවිධානයට සහය දක්වන දේශකවරයෙකුගේ දේශනා ඇසීමට පුරුදුව සිටි බවත් ඉල්හාම් අහමඩ් විසින් එම දේශකවරයාගේ දේශනා අසන ලෙස තමාටද යෝජනා කළ බව පැමිණිල්ලේ සාක්ෂි අංක 1 පවසා සිටින ලදී. තවද ඉල්හාම් අහමඩ් ISIS සංවිධානයට සම්බන්ධ බව පාස්කු ප්‍රහාරය සිදුවීමට මාසයකට පමණ පෙර 1 වන වූදිත ඉදිරියේද පවසා තිබෙන බවට සාක්ෂි ලබා දෙන ලදී. පෙර අවස්ථාවකදී ISIS සංවිධානයේ සාමාජිකත්වය තිබෙනවාද යනුවෙන් ඉන්ෂාෆ් අහමඩ් විසින් ඉල්හාම් අහමඩ්ගෙන් විමසා සිටි බවත් එම අවස්ථාවේදී ඉල්හාම් අහමඩ් විසින් ISIS හි සාමාජිකත්වය අවශ්‍ය නොමැති බවත් ඔවුන්ව අනුගමනය කිරීම පමණක් ප්‍රමාණවත් යනුවෙන් පවසා සිටි බවත් පැමිණිල්ලේ සාක්ෂි අංක 1 පවසා සිටින ලදී.

එමෙන්ම, ඉල්හාම් අහමඩ් ෂැන්ග්‍රිලා හෝටලය තුළදී බෝම්බයක් පුපුරවා ගනිමින් මරණයට පත් වූ බවත් ඉන්ෂාෆ් අහමඩ් වෙනත් හෝටලයක් තුළදී බෝම්බයක් පුපුරවා ගනිමින් මිය ගිය බවත් එම හෝටලයේ නම තමාට මතක නැති බවත් පැමිණිල්ලේ සාක්ෂි අංක 1 පවසා සිටින ලදී. එමෙන්ම 2019 අප්‍රේල් මස 21 වන දින සිදුවූ බෝම්බ ප්‍රහාරයට දින 2කට පෙර මහවිල ගා(ර්)ඩන්ස් හි පිහිටි මහ ගෙදරදී රාත්‍රී කාලයේදී පැමිණිල්ලේ සාක්ෂි අංක 1 හට ඉන්ෂාෆ් අහමඩ් මුණ ගැසුණු බවත් පසුව ඔහු විදෙස් ගත වීමට ගුවන්තොටුපළට යන බවට පවසමින් නිවසින් පිටව ගිය බවත් පැමිණිල්ලේ සාක්ෂි අංක 1 සාක්ෂි දෙමින් පවසා සිටින ලදී. එමෙන්ම පැමිණිල්ලේ සාක්ෂි අංක 1 මහවිල ගා(ර්)ඩන්ස් හි පිහිටි මහගෙදර සිටි දිනවලදී ෆාතිමා ජිෆ්රියා ඇගේ දරුවන් සමග පළමු වන මහලේ සිටිනවා තමා දැක ඇති බව ද සාක්ෂි දෙමින් පවසා

සිටින ලදී. තවදුරටත් පැමිණිල්ලේ සාක්ෂි අංක 1 පවසා සිටියේ තමාගේ බිරිඳට දරුවෙකු ලැබීමට සිටි බවත් මහවිල මහ ගෙදර සිටින අතරතුර තමා සහා බිරිඳ වෛද්‍යවරයෙකු හමුවීමට ගිය බවත් පාස්කු ප්‍රහාරය සිදුවීමට පෙර තමා විසින් ඉල්හාම් අහමඩ්ව දුටු ආසන්නතම දිනය එදින බවට පැමිණිල්ලේ සාක්ෂි අංක 1 හට මතක නොමැති බවත් ය.

එමෙන්ම 2019 අප්‍රේල් මස 20 වන දින තමා මධ්‍යම රාත්‍රිය වනතෙක් දුරකථනය භාවිත කරමින් සිට නින්දට ගිය බවත් එදින රාත්‍රියේදී තමා හට ඉල්හාම් අහමඩ් මුණ නොගැසුණු බවත් 2019 අප්‍රේල් මස 21 වන දින උදැසන 10ත් 12ත් අතර කාලයේදි තමා අවදි වූ බවත් එලෙස අවදි වී තමා පළමු මහළට පැමිණි බවත් ඒ මොහොතේදී 1 වන චූදිත පළමු මහළේ සිටිනවා තමා දුටු බවත් පැමිණිල්ලේ සාක්ෂි අංක 1 පවසා සිටින ලදී.

එමෙන්ම, 2019 අප්‍රේල් මස 21 වන දින පෙරවරු 10.00ට පමණ 1 වන චූදිත විසින් තමාට pen drive එකක තිබෙන යම් දෙයක් ඇසීමට 1 වන චූදිත ගේ කාමරයට එන ලෙසට පැවසූ බවත් තමා එම කාමරයට යන අවස්ථාවේ 1 චූදිතගේ බිරිඳ එනම් තමාගේ නැන්දම්මාද එම කාමරයේ සිටි බවත් ඉන් පසුව pen drive එක ලැප්ටොප් එකකට සම්බන්ධ කර තමාත් 1 වන චූදිත සහ ඔහුගේ බිරිඳත් එහි තිබූ හඬ පටයට ඇහුම්කන් දුන් බවත් එහි තිබුණේ ඉල්හාම් අහමඩ්ගේ කටහඬ බවත් නැවත වරක් එම හඬ පටයට ඇහුම්කන් දීමට අවස්ථාව ලබා දුනහොත් එය තමාට හඳුනාගත හැකි බවත් පැමිණිල්ලේ සාක්ෂි අංක 1 තවදුරටත් සාක්ෂි දෙමින් පවසා සිටින ලදී.

නමුත් එම හඬ පටය ධාවනය කර පැමිණිල්ලේ සාක්ෂි අංක 1 හට ඇසීමට සලස්වා අනතුරුව එමගින් ප්‍රශ්න ඇසීමට තරම් ප්‍රමාණවත් කාලයක් අද දින නොමැති බැවින් නඩුව වැඩිදුර විභාගයට කල් තබන ලදී.
පැමිණිල්ලේ සාක්ෂි අංක 1 මෙම නඩුවේ වැදගත් සාක්ෂිකරුවකු වන බැවින් ද එසේම ඔහු මෙම නඩුවේ චූදිතයන්ගේ සමීපතම ඥාතියෙක් වන බැවින් ද මෙම අධිකරණය ඉදිරියේ ලබාදීමට තිබෙන සාක්ෂිවලට කිසියම් හෝ බලපෑමක් ඇතිවිය හැකි ආකාරයෙන් මෙම නඩුවේ චූදිතයන් සමඟ සම්බන්ධතා, හමුවීම් හෝ කතාබස් කිරීම් ආදී කිසිවක් මෙම අධිකරණයේ සාක්ෂි ලබාදීම අවසන් වන තෙක් නොපැවැත්විය යුතු බවට මහාධිකරණ විනිසුරුතුමිය පැමිණිල්ලේ සාක්ෂි අංක 1 හට තරයේ අවවාද කර සිටින ලදී.

එහිදී, සාක්ෂි ලබාදීම අවසන් වන තුරු තමාට චූදිතයන් සමඟ පවුලේ සුහද හමුවීම්වලට සහභාගි විය නොහැකිදැයි පැමිණිල්ලේ සාක්ෂි අංක 1 විසින් මහාධිකරණ විනිසුරුතුමියගෙන් අසා සිටින ලදී. පැමිණිල්ලේ සාක්ෂි අංක 1 මෙම නඩුවේ චූදිතයන්ට විරුද්ධව සාක්ෂි ලබා දෙන බැවින් එවැනි හමුවීම් මගින් ඔහු ලබාදීමට බලාපොරොත්තු වන සාක්ෂි වලට මෙම නඩුවේ චූදිතයන්ගෙන් සෘජුව හෝ වක්‍රව බලපෑමක් ඇතිවිය හැකි බැවින් පැමිණිල්ලේ සාක්ෂි අංක 1 විසින් එවැනි සෑම හමුවීමක්ම ඔහු මෙම නඩුවේ සාක්ෂි ලබාදීම අවසන් කරන තුරු මගහැරිය යුතු බවට මහාධිකරණ විනිසුරුතුමිය විසින් නැවත වරක් පැමිණිල්ලේ සාක්ෂි අංක 1 හට තරයේ අවවාද කරන ලදී. එමෙන්ම පැමිණිලි සාක්ෂි අංක 1 අධිකරණය ඉදිරියේ ලබාදීමට බලාපොරොත්තු වන සාක්ෂිවලට සෘජුව හෝ වක්‍රව බලපෑම් කිරීම හෝ පැමිණිල්ලේ සාක්ෂි අංක 1 හට කිසියම් හෝ මානසිකව බලපෑමක් සිදුකිරීම මෙම නඩුවේ චූදිතයන් නොකළ යුතු බවටත් එසේ කළහොත් ඔවුන්ගේ ඇප අවලංගු කර ඔවුන්ව රිමාන්ඩ් ගත කිරීමට සිදුවන බවට මහාධිකරණ විනිසුරුවරිය විසින් චූදිතයන්ට තරයේ අවවාද කර සිටින ලදී.

අද දින සටහන් ගස්තු සහිතව විත්තියට නිකුත් කරන මෙන් නියෝග කරන ලදී.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1 හට ඉදිරි දිනයේදී නැවත අධිකරණයේ පෙනී සිටින ලෙසට අවවාද කරන ලදී.

**3. Any significant observations inside court room and outside? (උසාවි කාමරය තුළ සහ පිටත සැලකිය යුතු නිරීක්ෂණ තිබේද?) –**

**4. Next date & time (ඊළඟ දිනය සහ වේලාව):** 2025 සැප්තැම්බර් මස 29 වන දින පෙරවරු 8.30

අතිරේක දිනය: 2025 නොවැම්බර් මස 06 වන දින පස්වරු 1.30

**5. Media reports about the case on this date (මෙම නඩුව පිළිබඳ මාධ්‍ය වාර්තා):**